රුහුණ විශ්වවිද්‍යාලය

**2015/2016 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි - 2000 ස්ථලය**
**දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු**

# SLS 22633 – භාරතීය කාව්‍ය විචාරය

**<u>ප්‍රශ්න පහකට (05) පමණක්</u> පිළිතුරු සපයන්න.**

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකිය.

**කාලය : පැය 03**

---

01. ලාංකේය නූතන පද්‍ය විචාරය සඳහා අලංකාරවාදයෙහි උපයෝගීතාව විමසුමට ලක්කරන්න.

02. “විභාවානුභාවව්‍යභිචාරී සංයෝගාත් රස නිෂ්පත්තිඃ” යන රස සූත්‍රය ද ඇසුරු කොට ගෙන රස සංකල්පය සනිදර්ශන ව විභාග කරන්න.

03. ධ්වනිවාදය හා උත්ප්‍රේක්ෂාලංකාර පිළිබඳ සංක්ෂිප්ත විස්තර සපයන්න.

04. වක්‍රෝක්තිවාදය පිළිබඳ රාජානක කුන්තක පඬිවරයාගේ මතය කුමක් දැ යි පැහැදිළි කරන්න.

05. කාව්‍ය ගුණ හා රීති අතර සම්බන්ධය කෙබඳු දැ යි පෙරදිග විචාරක මත අනුව පහදන්න.

06. “ඖචිත්‍ය සංකල්පය භරතමුනිගේ <u>නාට්‍ය ශාස්ත්‍රයේ</u> සිට ම පෙරදිග විචාරකයන්ගේ අවධානයට ලක් වී තිබිණි.” මේ පිළිබඳ ව අදහස් දක්වන්න.

07. “ඖචිත්‍යං රස සිද්ධස්‍ය ස්ථිරං කාව්‍යස්‍ය ජීවිතම්” ඖචිත්‍යවාදයේ අරමුණ වූයේ එය කාව්‍යයේ ජීවය ලෙස හුවා දැක්වීම යි. විස්තර කරන්න.

08. පහත සඳහන් පද්‍ය පන්තිය භාරතීය කාව්‍ය විචාර සංකල්පවලට අනුව විචාරය කරන්න.

(309)

රූ රැසේ අදිනා ලෙසේ අත් ලෙළ දිදී විදුලිය පබා
රන් රසේ එක් වන ලෙසේ වෙණ නාද'නු පා තබ තබා
කම් පසේ දෙන සැර ලෙසේ දෙස බල බලා නෙතගින් සබා
මම් කෙසේ පවසම් එසේ වර සුර ලඳුන් දුන් රහ සොබා

(310)

පුන් මදාරා මල් දමින් මුදු දිගු සුනිල් වරලස ගොතා
මත් මදා කිතු ලිය ලෙසින් උර'තුර සරා දිලි මුතු ලතා
මත් නදා වන මිණි මෙවුල් නද වෙණ නදින් එක් කොට ඉතා
උන් එදා දුන් රහ දුටොත් තව සක් සැපත් කවරෙක් පතා

(311)

පිපි සමන් කුසුමන් පටින් තන රන් හසුන් මන් මෙන් බැඳේ
ළඹ සවන් දිගු රන් පයින් දන ගෙතත් මුවන් බඳිමින් තඳේ
මද පවන් වැද ලෙල පහන් සිළු මෙන් රැඟුම් දෙන රන් බඳේ
දිලි ඔවුන් රූ. සිරි නුවන් වන් බඹ වුවත් දැහැනින් මිදේ

(312)

පා පියුම් බිඟු රොන් සළාවන් දිලි රුවන් නූපුර ගොසේ
පාද ගම් රා නාද'නු කොට ගත් නැටුම් සුර'හන රැසේ
ලූ බැලුම් පමණින් සුරන් සිත් මත් කෙරෙත් මැයි නොකමසේ
ඒ රැඟුම් රහ දුටු දනන් නුමුළා වෙතියි පවසම් කෙසේ

(සෑම ප්‍රශ්නයකට ම ලකුණු 12 බැගින්)

@@@@@@@@@@@@@@@@